# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# සීමාසහිත ලංකා නැව් සංස්ථාව
**(වරාය, නාවික හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය)**

## ඇබෑර්තු

**පහත සඳහන් තනතුර පිරවීම සඳහා අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.**

### 1) සාමාන්‍යාධිකාරී තනතුර - HM 2-3 - (ඇබෑර්තු 01)

➢ **සුදුසුකම්** :

**බාහිර අපේක්ෂකයින් සඳහා** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක්

හෝ

නාවික ක්ෂේත්‍රය පිළිබඳව පිළිගත් වෘත්තීමය ආයතනයකින් ආයතනික/ පූර්ණ සමාජිකත්වය ලබා තිබීම.

සහ

නාවික ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් තිබීම. (වසරකට නොඅඩු)

සහ

නාවික ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්ද හා ඉන් අවුරුදු 5 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු ලෙස පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා** : ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නාවූ සුදුසුකම්

හෝ

සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද තිබීම.

➢ **වැටුප් ප්‍රමාණය** : HM 2-3- 2016: රු. (98,215 - 12 × 2700 - 130,615)

සංශෝධිත වැටුප අනුව, තෝරාගනු ලබන අපේක්ෂකයා 2019.01.01 දිනට HM 2:3 වැටුප් පරිමාණයේ මූලික වැටුප වන රු. 88,021/- වැටුපෙහි පිහිටවනු ලැබේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත සියළුම අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

➢ **වයස් සීමාව** : වයස අවුරුදු 35 ට වඩා නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

ඉහළ වයස් සීමාව අභ්‍යන්තර හා රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට අදාළ නොවේ.

➢ **බඳවා ගැනීමේ ක්‍රමය** : ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

➢ **ප්‍රතිලාභ :**

1. සේ. අ. අ./ සේ. නි. භා. අ.
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම්.
3. සම්පූර්ණ පුද්ගල හදිසි අනතුරු ආවරණය.
4. භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කළ හැකි වීම.
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාළ පරිදි
6. සහනශීලී නියමයන් මත සේවක මණ්ඩල සහ නිවාස ණය
7. සහනශීලී වාහන ණය
8. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛන අංක: 5/2017 ට අනුව ඇති වෘත්තීමය දීමනා
9. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 1/2015(i) අනුව ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

**පොදු කොන්දේසි**

- සියලුම අයදුම්පත් තමා විසින් සහතික කළ අධ්‍යාපන/ වෘත්තීය සහතිකපත්වල පිටපත් සමග උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිතව ලියාපදිංචි තැපෑලෙන් **2019 සැප්තැම්බර් 25** වන දින හෝ ඊට පෙර සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව වෙත එවිය යුතු ය.
- කරුණාකර අයදුම්පත එවන ලිපිකවරයේ වම්පස කෙලවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් මගින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑමක් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය),**
**කොළඹ 01**

Source: Silumina, Sunday Observer (2019.09.08)